**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2021**
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ කෝවිඩ් 19 වසංගත තත්වයෙන් පීඩාවට පත්වූවන්ට සහන සැලසීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය මුදල් ලබාදීමට නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල සතු වටිනාකම රු. 892,266,391 ක්වූ ස්ථාවර තැන්පතු 14 ක් ඇප ලෙස තබා බැංකුව වෙතින් ලබාගත් ණය මුදල හා තවදුරටත් ගෙවීමට ඇති පොළිය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා බැරකම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා බැරකම් වශයෙන් ගිණුම්ගත කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි | 2023 වර්ෂයේදී මේ වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වාර්තාව තුල මුදල් වෙන් කර ඇත. | වාර්ෂිකව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුයි. |
| (ඇ) | සම්පූර්ණයෙන්ම ක්ෂය වි ඇති පිරිවැය රු.835,588 ක්වූ පරිගණක වලින් දැනට භාවිතාකරන පරිගණක වල ධාරණ අගය ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ දී දැනට භාවිතා කරනු ලබන පරිගණක වල ධාරන අගය ගණනය කර ඇති බැවින් 2022 වර්ෂයේ ගිණුම්වල එම අගය සටහන් තැබීමට කටයුතු කරනු ලැබේ. | වත්කමේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුයි. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 876 (3) | ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වා ගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළයුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අදාල වාර්තා හා ලේඛන නීති අංශය වෙත ලබාදී ඇති අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව දන්වන ලදී. මෙතෙක් අප වෙත නීතිපති දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු ලැබී නොමැත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 221,057,494ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු527,156,143 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 306,098,649 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල හා ආයෝජන පොලී ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කලමණාකරන අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි මාලාව අනුව සෑම දිනුම් ඇදීමක් සිදුකිරීමට පෙර ඒ ඒ මාසයේ සමෘද්ධි සහනාධාරයෙන් ඉවත් වූ සහ අළුතින් සහනාධාර ලැබූ ප්‍රතිලාභීන්ගේ තොරතුරු පරිගණක දත්ත සමුදායට ඇතුළත් කර සමෘද්ධි සහනාධාරලාභී නාමලේඛන ප්‍රතිලාභ කළමනාකරණ මොඩියුලය තුළින් තොරතුරු යාවත්කාලීන කලයුතු වුවත්, එසේ යාවත් කාලීන නොකිරීම මත 2018 සිට 2021 ඔක්තෝබර් දක්වා ප්‍රතිලාභීන් 309 ගේ ත්‍යාග මුදල් අත්හිටුවා තිබුණි. ඒ අනුව නිවැරදි යාවත්කාලීන කිරීම් ප්‍රමාද වීම මත වෙනත් ප්‍රතිලාභියකුට ජයග්‍රහණයක් හිමිවීමේ අවස්ථාව අහිමි වීමෙන් රු. 61,800,000 ක ත්‍යාග මුදල් ලබාදීමට නොහැකි වී තිබුණි. | අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් Zoom තාක්ෂණය ඔස්සේ 2023/02/16 දින අදාල නිලධාරින් දැනුවත් කොට CRM මොඩියුලය මාසිකව යාවත්කාලින කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | දත්ත පද්ධතිය යාවත්කාලීන කර ප්‍රතිලාභීන්ගේ ත්‍යාග මුදල් ලබා දීමට කටයුතු කල යුතුයි |
| (ආ) | DDD/HO/6/M/01/2017/01 හා 2017 ජනවාරි 13 දිනැති නිවාස ලොතරැයි ත්‍යාග ලබාදීමට අදාළව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ජයග්‍රහණය හිමි වී ත්‍යාග මුදල් ලබාගත් අයකු සඳහා නැවත දිනුම් වාරයකදී ත්‍යාග මුදල් පිරිනැමීම සිදු නොකල යුතු බව දක්වා තිබුණි. ඒ අනුව ජයග්‍රහණය හිමි ත්‍යාග මුදල් ලබාගත් පුද්ගලයන් සඳහා නැවත ජයග්‍රහණයක් හිමි නොවන ආකාරයට ලොතරැයි දිනුම් ඇදිමේ පරිගණක පද්ධතිය සකස් නොකිරීම මත පෙර | නිවාස ලොතරැයි ජයග්‍රහණ ලබාගැනීමේදී එක් දිනුම් අවස්තාවක් හිමිකරගෙන ජයග්‍රහණ අත්පත් කරගත් ප්‍රතිලාභියෙකුට නැවත වසර 10කට පසු ජයග්‍රහණයක් හිමිකර ගැනීමට අවස්ථාව සලසන ලෙස නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත. නමුත් CRM පද්ධතිය තුල එක්වරක් ජයග්‍රහණය කරන ලද ත්‍යාගලාභීන් වෙනම ගොනුවකට තාවකාලිකව ඉවත් කර තැබීමට තොරතුරු තාක්ෂණ අංශයට | දත්ත පද්ධතිය යාවත්කාලීන කර ප්‍රතිලාභීන්ගේ ත්‍යාග මුදල් ලබා දීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ජයග්‍රහණය කල ප්‍රතිලාභීන්හට නැවත ජයග්‍රහණය හිමිවී තිබුණි. 2018 නොවැම්බර් සිට 2021 ඔක්තෝබර් දක්වා එලෙස අත්හිටුවා ත්‍යාග සංඛ්‍යාව 50 කි. ඒ අනුව ජයග්‍රහණය කල මුදල් ලබාගත් ප්‍රතිලාභීන් පද්ධතිය තුළින් නැවත ජයග්‍රහණයක් හිමිවීම වලක්වාලන නිසි ක්‍රමවේදයක් නොමැතිවීම මත වෙනත් ප්‍රතිලාභීන් 50 කට ලබාගත හැකිව තිබූ රු. 10,000,000 ක ත්‍යාග මුදල් අහිමි වී තිබුණි. | උපදෙස් ලබාදී ඇති අතර ඇතැම් අවස්ථාවල නැවත ජයග්‍රහණයක් පද්ධතිය තුල සිටින ප්‍රතිලාභීන් හට ලබාගැනීම දැකිය හැකිය. | |
| (ඇ) | 2021 පෙබරවාරි 01 දිනැති සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල රෙගුලාසි මාලාවේ 26 වන ඡේදය ප්‍රකාරව සෑම දිනුම් ඇදීමක්ම අවසානයේ එම දිනුම් ඇදීම සිදුකල දින සිට මාස 03 ක් ගතවන කල් පමණක් ත්‍යාග ලබාදීම සිදුකල යුතු අතර ලබාදීමට අපොහොසත් වන ත්‍යාග සඳහා ඉතිරි වන මුදල් එම කාලසීමාව අවසානයේ ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි අරමුදල් ගිණුමට බැරකල යුතුය. එසේ වුවද, ඊට පටහැනිව ත්‍යාග 9 කට අදාළ රු. 1,800,000 මුදලක් මාස 04 ත් මාස 08 දක්වා කාල ප්‍රමාදයක් සහිතව අරමුදලට බැර කර තිබුණි. | මාස 03 වැඩි කාලයක් ගතවී තිබේනම් අරමුදලේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැති බව පිළිගනු ඇත. දිස්ත්‍රික් කාර්යාලවලදී මෙම කාලසීමාවට යටත්ව ගැටළු ඇති වූ බව දැකගතහැකි වන අතර ප්‍රධාන කාර්යාලය මගින් මාස 03 ඇතුලත ගෙවීම් කටයුතු නිම කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. | ත්‍යාග සඳහා ඉතිරි වන මුදල් අදාල කාලසීමාව ඇතුලත ප්‍රධාන කාර්යාලයේ නිවාස ලොතරැයි අරමුදල් ගිණුමට බැරකල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 877(2) ඇ ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 24 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් අනතුරුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කොට ඉදිරිපත් කිරීම නිසා ඡේදයෙහි සඳහන් කාල පමාව සිදුවී ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ආයතන ප්‍රධානීන්ගෙන් ලද උපදෙස් අනුව 2022 වර්ෂයේ සිට ඉදිරියට අයවැය වාර්තාව සකස් කරන ලදී. මීට පෙර වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ අනුව වියදම් දරා ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ අයවැය ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |